# පිරිසිදු ව, වීරගතියෙන් විසීම, පින් පොතක් තබා ගැනීම

සිරි වජිරාරාමාධිපති ව වැඩ විසූ
අපවත් වී වදාළ අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ විසිනි.

හොඳ බෞද්ධ ළමයා ගේ ඇතුළතත් පිටතත් පිරිසිදු ය. තමාගේ සිත පිරිසිදු කරගැනීමට හේ උත්සාහ දරයි. බොහෝ විට සිතට නරක අදහස් ඇති වන්නේ නිකම් සිටින වේලෙහි ය. එහෙයින් එබඳු වේලාවන්හි මෙත් වැඩීම හෝ හොඳ අදහස් ඇති කවියක් හෝ ගාථාවක් හෝ සින්දුවක් කීම මැනවි. තමා ගේ අදහස්වල හැටියට ගතිය ඇතිවන බව සිතන්න.

පිටතින් ද පිරිසිදු විය යුතු ය. ඇඟපත හා මුව නිතර සෝද ගත යුතු ය. නියපොතු දිගට වැඩෙන්නට නො දෙන්න. නියපොතු නො කන්නටත් ඇඟිලි කටේ නො දමන්නටත් සිහි තබා ගන්න. යමකු ඉදිරියෙහි දී නාසයේ තමන් ඇඟිලි දැමීම නො මැනැවි. යමකු ඉදිරිපිට දත් මදින විට ද අතින් මුව වසා එසේ කිරීම මැනැවි. අනුන් ඉදිරියෙහි ඔළුව කැසීම ඇට කැඩීම නො මැනැවි.

අඳින ඇඳුම් කිලිටි නොකර පිරිසිදුව තබා ගන්න. හැකි නම් තමා ගේ ඇඳුම් තමා ම සෝද ගැනීම මැනැවි.

මුව පිස ගැනීම් ආදියට නිතර ම ලේන්සුවක් පාවිච්චි කරන්න

ගෙදර බඩු මුට්ටු පිරිසිදු ව තබා ගැනීමට උපකාර කරන්න.

පත්පොත් ද කවර දමා පිරිසිදු ව තබා ගන්න. පොත්වල නම කීපවිටක් ලියා කැත කිරීම නො මැනැවි. පෑනෙන් ලියා හිසෙහි තීන්ත පිස නො දමන්න. පාසලේ දී හෝ ගෙදර කඩදසි කැබැලි ඒ ඒ තැන නො දමන්න. හොඳ ළමයා හැම තැන ම හැම අතින් ම පිරිසිදු විය යුතු ය.

මැළි නොවී බිය නොවී හුරුබුහුටි නිර්භීත ළමයකු වන්න.

කළ යුතු දේ කිරීමට මැළි නොවන්න. හැම කටයුත්තෙහි දීම ම ක්‍රියාශූර වන්න. කම්මැළි ව නිකරුණේ මොහොතක් වත් ගත නොකරන්න. කරනට දෙයක් නොමැති නම් ගාථාවක් හෝ කවියක් හෝ සින්දුවක් කියන්න.

ඉඩ තිබෙන වේලාවල දී අමුතු දෙයක් ඉගැනීමට උත්සාහ දරන්න.

කථාවක් හෝ බණක් අසන විට පොතක් බලන විට නිතර පැන්සලයක් හා කුඩා සටහන් පොතක් පාවිච්චි කිරීම මැනැවි. අමුතු සැලැකිය යුතු දෙයක් ඇසූ දුටු වහා ම පොතෙහි සඳහන් කරගන්න.

යමක් කිරීමෙහි දී "බැරි ය" කියා නොසිතන්න. "පුළුවනි" යන මන්ත්‍රය ජපකොට කළ හොත් අමාරු දෙය වුවත් පහසු වෙයි.

යමක් වැරැදුණ විට බැරිය ය යි පසුබට නොවන්න. "නො නැවත ඉදිරියට යමු" යන අවවාදය නිතර සිහිතබා ගන්න. පස්සට නොගොස් ඉදිරියට ම ගමන් කරන්න.

හොඳ බෞද්ධ ළමයා පවට වරදට මිස වෙන කිසිවකට බිය නො වෙයි. බිය යනු කුමක් ද යි තමාගෙන් ම අසන්න. නුදුටු යකුන් හට වත් ප්‍රේතයන් හට වත් බිය නොවන්න. කළුවරේ තනියම යන්නට වත් ඉන්නට වත් බිය නොවන්න. සිතින් මවන හොල්මන්වලටත් බිය නොවන්න.

මැරෙන්නට වත් බිය නොවන්න.

දුටුගැමුණු, පරාක්‍රමබාහු, විහාරමහා දේවි, මද්දුමබණ්ඩා, කැප්පෙටිපොල ආදී වීරවරයන්ගේ ද වීරවරියන්ගේ ද නිර්භීත ලේ මේ වීර ළමයින්ගේ නහර ඔස්සේ තව ම ගමන් කරන බව සිතන්න.

කිසිවකු ට බිය නො උපදවන්න.

එලෙස ම කිසිවකුට වත් බිය නොවන්න.

ආත්ම ගෞරවයට හෙවත් තමන්ගේ නම්බුවට කැළලක් සිදුවන දෙයක් කිසි කලෙක නොකිරීමට ද උත්සාහ දරන්න. කොපමණ හා (කුසගිනි) වුවත් කෙසරිඳු තණ කබල නුබුදින බව මේ හොඳ සිංහල

ළමයා දනියි. තණ කොළ කෑම සිංහයාට නො හොබී. සිංහ ගති ඇති සිංහල පැටවු තමන් ගේ තත්ත්වයට නො ගැළපෙන දේ නො කෙරෙති.
හොරෙන් අසු නොවී යම් වරදක් කිරීමට ඉඩක් ලැබුණත් හොඳ ළමයා එසේ නො කරයි. හොඳ බෞද්ධ ළමයා කරන කියන හොඳ දේ ලිවීමට පින් පොතක් තබා ගනියි.

දිනපතා යම් හොඳ කටයුත්තක් කිරීමට කල්පනාවට ගන්න. සැලකිය යුතු සියලු හොඳ දේවල් ඒ පොතෙහි ලියන්න. මල් පහන් පිදීම, මවුපියන් වැඳීම, වන්දනාවේ යෑම ආදිය පමණක් හොඳ දේවල් යයි නොසිතන්න. ඒ හොඳ පින් දහම් කඩ නො කොට පුරුදු කරන්න. දෙළොස් පුණ්‍ය ක්‍රියා වස්තු හොඳින් දැනගෙන හැකි පමණ එබඳු පින්කම් ද කරන්න.

මෙබඳු හොඳ දේවලින් තමාගේ පින් පොත හැකි පමණ සරසා ගැනීමට උත්සාහ දරන්න.

මේ දස වන පිළිවෙත පිරීමෙන් පිරිසිදුකම, ශූරවීර ගතිය, පින් කිරීමට උනන්දුව යන ආදිය දියුණු වේ.

හොඳ බෞද්ධ ළමයා මේ දස පිළිවෙත නිතර සිහි කරමින් ඒ හැම ශක්ති ප්‍රමාණයෙන් පුරුදු කිරීමට උත්සාහ දැරිය යුතු ය.

මෙබඳු ප්‍රතිපත්ති ගරුක ආදර්ශවත් බෞද්ධ ළමයා සිය දෑ රට සමයට පමණක් නොව, මුළු ලොවට ම ආශිර්වාදයක් වන්නේ ය. මනා පිළිවෙත් පුරන මෙබඳු ගුණවත් ගැහැණු පිරිමි දරුවන් ගෙන් අප ශ්‍රී ලංකාව බැබැළේ වා !

***(2562/2018 වෙසක් බෞද්ධ ළමයා කලාපයෙන් උපුටා ගන්නා ලද්දකි)***

Go to Table of Contents